# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1 ශ්‍රේණිය - බුද්ධ ධර්මය - අප්‍රේල් මාසය - 4 වන සතිය

සැකසුම :- බලංගොඩ අධ්‍යාපන කලාපය.
ප්‍රා. ගුරු උපදේශක :- බන්දුප්‍රේම ඕපනායක

- දූලා පුතාලා අහලා තියෙනවා නේද රාහුල පොඩි හාමුදුරුවෝ ගැන.
- රාහුල පොඩි හාමුදුරුවෝ අවවාද අහන්න හරිම ආසයි .
- අහන සෑම හොද අවවාදයක්ම පිළිපදිනවා.
- උදේම නැගිටලා වැලි දෝතක් අතට අරගෙන මේ තරමටම මට අවවාද ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.
- ඉතින් දැන් අපි කරන්න යන්නේ රාහුල පොඩි හාමුදුරුවෝ ගැන කියැවෙන කවි දෙකක් ගායනා කරන්න.
- නිතර ගායනා කර කට පාඩම් කර ගන්න.
- චූටි ඔයාලාට තනියම බැරිවෙයි.
- අම්මාගෙන් තාත්තාගෙන් උදව් ලබා ගන්න.

1. මෙත් සිසිලෙන් සිත පුරවා - වැලි දෝතක් ගෙන උඩ දා
   වැලි කැට ගණනට සැමදා - වැඩිහිටි ඔවදන් පැතුවා.

2. රාහුල සමිදුගේ මුහුණේ - ප්‍රිය බව නිතරම රැදුනේ
   ශික්ෂාවෙන් අග තැන්පත් - තනතුර සමිදුට ලැබුණේ .

- ඔයාලත් වැඩිහිටි අවවාද පිළිගැනීම පුරුද්දක් කරගන්න.

**"හොදයි ආදරණීය දුවේ, පුතේ ඔයාලට තෙරුවන් සරණයි!"**